**අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2021**

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය අතර 2016 දෙසැම්බර් 01 දින එළඹි අංක සීඑල්කේ - 100901 ආර් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 වගන්තිය හා 2017 අගෝස්තු 31 වන දින එළඹි සංශෝධිත ණය පහසුකම් ගිවිසුමේ 3.4.4 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ඇතුළත් විධානය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රැක ගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,779.95 කට සමාන යුරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු. මිලියන 8,149.96 කට සමාන යුරෝ මිලියන 52 ක් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට සැලසුම කර තිබුණි. කෙසේවෙතත්, සංශෝධිත ගිවිසුම අනුව ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරිමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්ම සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව මූල්‍ය ප්‍රකාශනයේ මහා භාණ්ඩාගාරයට සෘජුවම ලබා දී ඇති මුදල් ප්‍රමාණයේ වටිනාකම රු. මිලියන 4.94කින් වැඩියෙන් දක්වා තිබුණු අතර ණය මුදලේ ශේෂය රු. මිලියන 2.58කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2.58 | ව්‍යාපෘතිය ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය සමග, ඩොලර් ගිණුම් සහ ව්‍යාපෘති ජංගම ගිණුම් දත්ත මත පදනම්ව ගිණුම් සකස් කරන අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සංසන්දනය කරනු නොලැබේ. | නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකුට සෘජුවම ලබාදුන් මුදල්වල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | 2.35 | ව්‍යාපෘති ගෙවීම් වවුචරය රුපියල් වටිනාකම මත සිදු කරන අතර සහ සෘජු ගෙවීම් මත විනිමය ගැලපුම් අපගේ ගිණුම් පොත්වල සිදු නොකෙරේ. | නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.9.2 සහ 7.9.11 ඡේදය | අනුරාධපුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ සංවර්ධනය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 920.44ක් වූ අතර කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කළ වටිනාකම රු. මිලියන 1,176.12ක් වූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මුදල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 30.2 කින් වැඩි විය. මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍ර අයිතමවල ඉංජිනේරු ඇස්තමේන්තුව සහ අදාළ පිරිනමන මිල සමඟ මිල විශ්ලේෂණය සිදු කර නොතිබුණි. තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ මිලවල අපගමනය සියයට 1-93 දක්වා අඩු තක්සේරුවක් සහ සියයට 1- 4483ක් අධි තක්සේරුවක් නිරීක්ෂණය විය. | එකග වේ.<br>ඩීඩීඑස් (DDS) විසින් 2020 දී සකස් කරන ලද ඇස්තමේන්තුව අනුව, අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ඇස්තමේන්තුව සංශෝධනය කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව ඇස්තමේන්තුව සංශෝධනය කර ඇති අතර වටිනාකම රු. මිලියන 1,110.51ක් විය. එවිට වෙනස් වූ වටිනාකම 6.2% ක් පමණි. | ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 ඡේදය | උපදේශන කාර්යයේ කොන්ත්‍රාත් කාලය 2022 මාර්තු 31 දිනෙන් අවසන් වී ඇත. උපදේශක විසින් ලබාදිය යුතු වාර්තා (විස්තරාත්මක සැලසුම්) 2022 මාර්තු 31 දින ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කර ඇත. කෙසේවෙතත්, උපදේශන කොන්ත්‍රාත්කරු වෙත අවසන් ගෙවීම් මේවන විටත් සිදු කර නොමැත. 2022 මාර්තු 31 අවසන් වන දිනට ඉතිරි රු. මිලියන 18ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය අය කර ගැනීමට හෝ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැඳුම්කර ඇපකරයේ කාලය දීර්ඝ කර නොතිබූ බව නිරීක්ෂණය විය. | එකගවේ.<br>ගෙවීම් අවසන් කිරීම අවසන් අදියරේ පවතින බැවින් සහතික කරන ගෙවීම් සහතිකයෙන් සම්පූර්ණ මුදල අය කර ගැනීමට නියමිතය. | ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය

| | සංරචකය / උප සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | 2021 දෙසැම්බර් 31 දිනට අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | තිරසාර නාගරික යටිතල පහසුකම් | නාගරික යටිතල පහසුකම් සංවර්ධනය | 100% | නොමැත | ණය පහසුකම් ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය විසින් 2021 වර්ෂය අවසන් වන විට රු. මිලියන 6,562.68ක් වටිනා පැකේජ 12ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කළ යුතුය.<br>කෙසේවෙතත්, උපදේශන කාර්යයේ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම්වල ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 5,925.19ක් වටිනා පැකේජ 08ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින්, ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කිරීමට සිදු විය. | එකගවේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | පොදු ස්ථාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන<br>(i) දුම්රිය ප්ලාසා ඉදිකිරීම | සිවිල් කටයුතු | 90% | 80% | 2020 ජූලි 06 වන දින දුම්රිය ප්ලාසා ඉදිකිරීම සහ සිංහ කණුව වටරවුම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මිලියන 122.62කට කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණු අතර 2021 ජූලි 21 දින නිම කිරීමට නියමිත විය. ව්‍යාපෘතිය 2022 මාර්තු 14 දක්වා 03 වතාවක් දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත | එකග වේ.<br>රටෙහි පැවති තත්ත්වය හේතුවෙන් වේ. | ප්‍රමාදයන් මග හරවාගැනීමට සහ පිරිවැය ඉතිරි කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ii) | විවේකාගාර මධ්‍යස්ථාන ඉදිකිරීම | 90% | 80% | වර්ෂය අවසානය වන විට දරන ලද මුළු වියදම රු. මිලියන 23.79ක් වූ අතර එදිනට සියයට 10ක මන්දගාමී භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි. | | |
| (iii) | දානශාලා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම | 90% | 80% | | | |
| (ඇ) | සිංහ කණුව වටරවුම ඉදිකිරීම | 86% | 65% | ප්‍රමාණ පත්‍රය සහ ඉංජිනේරු සැලසුම් අතර නොගැලපීම සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ නිසි සම්බන්ධීකරණයකින් තොරව සැලසුම් සකස් කිරීම හේතුවෙන් මූලික සැලසුම් වෙනස් කිරීමට සිදු වීම ප්‍රමාදයට හේතු විය. | එකඟ වේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී මහා බෝධියේ නැගෙනහිර දොරටුවේ රථ ගාල ඉදිකිරීම | 90% | 75% | ශ්‍රී මහා බෝධි නැඟෙනහිර දොරටු රථගාල ප්‍රතිසංස්කරණය කිරීම සහ අර්ථ නිරූපණ පුවරු ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2020 සැප්තැම්බර් 10 වැනි දින මුළු කොන්ත්‍රාත්තු මුදල රු. මිලියන 213.63කට පිරිනමා තිබුණු අතර එය 2021 නොවැම්බර් 30 වන දින නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය විසින් තෙවරක් කාලය දීර්ඝ කිරීම් අනුමත කර ඇත. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට දරන ලද මුළු වියදම රු. මිලියන 69.49ක් වූ අතර එදිනට සියයට 15ක මන්දගාමී භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි. | එකඟ වේ. රටේ පවතින තත්ත්වය හේතුවෙන් වේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඉ) | (i) පූජා නගරයේ අර්ථකථන නාම පුවරු සවි කිරීම | 89% | 65% | වාහන නැවැත්වීමේ ස්ථානය වටා අර්ථකථන පුවරු 132ක් ඉදිකිරීම සඳහා ප්‍රමාණ පත්‍රයේ 3.1.1 සහ 3.1.2 අයිතම යටතේ රු. මිලියන 9.65ක් වෙන්කරන ලද අතර කොන්ත්‍රාත්තුව 2022 පෙබරවාරි 25 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, නියමිත දිනයක් සඳහන් නොකර එම අර්ථකථන පුවරු සඳහා මෘදු පිටපත්වල විස්තර ලිවීමට උපදේශකවරයකු වෙත 2021 පෙබරවාරි 17 වැනි දින රුපියල් 369,600ක් ලබා දී ඇත. කෙසේවෙතත්, ඉහත හේතුව නිසා 2022 ඔක්තෝබර් 13 වන දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. | එකඟ වේ. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් විධිමත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීමට ලක් කළ යුතුය. |
| (ඊ) | (i) සුරපුර එළිමහන් රංග පීඨය ප්‍රතිසංස්කරණය කිරීම | 56% | 38% | සුරපුර එළිමහන් රංග පීඨය, එස්එල්බීසී (SLBC) එළිමහන් රංග පීඨය ප්‍රතිසංවර්ධනය කිරීම සහ ධර්මපාල මාවතේ භූමි අලංකරණය සඳහා වන කොන්ත්‍රාත්තුව රු. මිලියන 348.60ක කොන්ත්‍රාත් මුදලකට 2021 අප්‍රේල් 27 වන දින පිරිනමා තිබුණු අතර 2022 අප්‍රේල් 26 වන දින නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ව්‍යාපෘති වැඩබිම දින 21 ක් වසා දමා තිබුණි. වැඩ සැලැස්මට අනුව ඉදිකිරීම් කටයුතුවල කාර්යසාධනය අඩු වී තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් සංශෝධිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට දරන ලද මුළු වියදම | එකඟ විය. රටේ පවතින තත්ත්වය හේතුවෙන් වේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| | (ii) එස්එල්බීසී (SLBC) එළිමහන් රංග පීඨය ප්‍රතිසංස්කරණය කිරීම | 56% | 38% | | | |
| | (iiii) ධර්මපාල මාවතේ භූමි අලංකරණය | 40% | 32% | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | රු. මිලියන 83.2ක් වූ අතර එදිනට සියයට 20ක මන්දගාමී භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි. | | |
| (උ) | (i) ශ්‍රී මහා බෝධි දොරටුවේ රථගාල | 54% | 12% | ස්ථාන තුනක රථගාල් ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 262.34කට පිරිනමා තිබුණු අතර 2022 අගෝස්තු 15 දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය නිම කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමීප අධීක්ෂණයක් නොතිබීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය දුර්වල වී ඇති බව නිරීක්ෂණය විය. | එකඟ විය. රටේ පවතින තත්ත්වය හේතුවෙන් වේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| | (ii) මිරිසවැටිය රථගාල | 40% | 14% | | | |
| | (iii) ලංකාරාමය රථගාල | 37% | 10% | | | |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සවිස්තරාත්මක නිර්මාණ අධ්‍යයන උපදේශන සේවා ප්‍රසම්පාදනය සඳහා ව්‍යාපෘතිය 2017 අගෝස්තු 29 වැනි දින එස්සීඊ, ගෘප් හිට්-ග්‍රීන් ටෙක් කන්සල්ටන්ස් (SCE, Group Hit – Green Tech Consultants) බද්ධ ව්‍යාපාරය සමඟ රු. මිලියන 212.66කට (යුරෝ මිලියන 1.18) ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව, උපදේශකවරයා විසින් සම්පූර්ණ කරන ලද උපදේශන වාර්තාව 2019 මැයි 12 වන දින ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, නියමිත දිනය සිව් වතාවක් සංශෝධනය කර ඇත. තවද, මෙම කොන්ත්‍රාත්තුව යටතේ ලබාදිය යුතු වාර්තා 18ක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අතර සහ වාර්තා 17ක් නියමිත වේලාවට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, ගිවිසුමේ 46.2 වගන්තියට අනුව, නියමිත වේලාවට වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් ආයතනයෙන් රු. මිලියන 59ක ප්‍රමාද හානි අයකරගත යුතු අතර එම මුදල 2021 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | එකග වේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 අප්‍රේල් මාසයේදී, අපජල කළමනාකරණ සංරචකය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ලෙස වාර්තා 04ක් ඉදිරිපත් කිරීමට මුල් උපදේශන ආයතනයට අමතර උපදේශන කාර්යයක් ලබා දෙන ලදි. මෙම අතිරේක කාර්යය හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ වටිනාකම යුරෝ 106,080 සහ රු. මිලියන 89.63 + වෙන්කළ මුදල (PS) රු. මිලියන 50 එකතුව රු. මිලියන 139.63 දක්වා වැඩි වී ඇත. ඒ අනුව, උපදේශකවරයා විසින් අනුරාධපුර නගරයේ අපජල කළමනාකරණ පද්ධතිය සඳහා වන අවසන් ශක්‍යතා වාර්තාව 2020 ජූලි 24 වන දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | එකඟ වේ. | ව්‍යාපෘති අරමුණ සම්පූර්ණ කිරීම සඳහා කළමනාකාරිත්වය සහතික විය යුතුය. |
| (ඇ) | අනුරාධපුරයේ දුම්රිය ප්ලාසා ඉදිකිරීම සහ සිංහ කණු වටරවුම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන රු. මිලියන 122ක් වටිනා ප්‍රමාණ පත්‍රය යථාර්ථවාදීව සකස් කර නොතිබුණි. එබැවින් 2022 මැයි මස අවසානයේදී අමතර වැඩ ලෙස රු. මිලියන 7.5ක් ගෙවා ඇති අතර එය ප්‍රමාණ පත්‍රයේ වටිනාකමෙන් සියයට 6.18 විය. | එකඟ වේ. | නියමිත වේලාවට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී මහා බෝධි නැඟෙනහිර දොරටුවේ රථගාල ඉදිකිරීම සඳහා ඉඩමේ අයිතිය නිරවුල් කර නොතිබුණි. | නායක හාමුදුරුවන් සහ අනුරාධපුර නගර සභාව සමඟ සාකච්ඡා කරනු ඇත. | රජයේ රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ඉ) | ධර්මපාල මාවත සංවර්ධනයට සහ භූමි අලංකරණ කටයුතු සඳහා අතුරා ඇති සියලුම කුට්ටි ගල් ඉවත් කිරීමට රු. මිලියන 24.6ක් වෙන් කර ඇත. ඉදිකිරීම් කටයුතුවලදී හොඳ තත්ත්වයේ කුට්ටි ගල් නැවත භාවිත කිරීමට තීරණය කර මිල ගණන් රු. මිලියන 1.7ක් ලෙස සංශෝධනය කර තිබුණි. කෙසේවෙතත්, ගලවා නැවත භාවිත කළ කුට්ටි ගල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීමට පියවර ගෙන නොතිබුණි. | එකඟ වේ.<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සහ මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම් සිදුකර ඇත. | උපදේශන සේවා කොන්ත්‍රාත්තුවේ මෙවැනි අවිනිශ්චිත ගැටලු අවම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන ලද ඉදිකිරීම් පැකේජ 04ක් සම්බන්ධයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවේ දක්වා ඇති වටිනාකමින් සියයට 10ත් 7ත් අතර සැලකිය යුතු වෙනසක් සහිතව කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර තිබුණි. කෙසේවෙතත්, එම අයිතමයන් සඳහා මිල විශ්ලේෂණය සිදු කර නොමැති අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයද අනුගමනය කර නොතිබුණි. ඒ අනුව සකස් කරන ලද ප්‍රමාණ පත්‍රයේ වටිනාකම යථාර්ථවාදී නොවන බව නිරීක්ෂණය විය. | එකග වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතු අතර පිරිවැය ඇස්තමේන්තුව සමඟ සැලසුම සමාලෝචනය කළ යුතුය. |
| (උ) | අනුරාධපුර නගරයේ කාර්යබහුලත්වය හේතුවෙන් රු. මිලියන 877ක් වටිනා වෙළඳපල ගොඩනැගිල්ල සහ බහුමහල් රථගාල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණු අතර ඉදිකිරීම් කටයුතුවලදී අගතියට පත් වූ පාර්ශ්වයන්ට වන්දි ගෙවීමට සිදු විය. මේ අනුව, ව්‍යාපෘතිය නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය. | සටහන් කර ගන්නා ලදි. | ව්‍යාපෘති අරමුදල් ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීම සඳහා යොදවා ගත යුතුය.<br>ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලින් සිදුවිය හැකි බලපෑම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |